**ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල 19ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ රැස් කර බැංකු ගත කර තිබුණු සුරාබදු ආදායමට ඇතුළත් විය යුතු ඉල්ලුම් පත්‍ර ගාස්තු, පොල් ගස් මැදීමේ බලපත්‍ර ගාස්තු හා රා එකතු කිරීමේ මධ්‍යස්ථාන ගාස්තුවල එකතුව වු රු. 16,385,875 ක ආදායමක් හා දුම්කොළ බදු ආදායමට ඇතුළත් විය යුතු රු.99,650 ක ආදායමක් ගිණුම්වල අඩුවෙන් දැක්වුණි. | 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගත වී තිබුණ ද එම ආදායම් වලට අදාළ වාර්තා ප්‍රාදේශීය කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට ඇති දුෂ්කරතා හේතුවෙන් මෙම ආදායම් දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කිරීමට අපහසු වී ඇත. | වර්ෂයට අදාළ සුරාබදු අදායම් නිවැරදිව හඳුනාගෙන, ගිණුම් ගතකල යුතුය. |
| **(ii)** | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල 19ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ රැස් කර බැංකු ගත කර ඇති රජයේ ආදායමට බැර විය යුතු රු.1,256,267 ක ආදායමක් අඩුවෙන් දක්වා තිබුණි. | එම | රාජ්‍ය ගිණුම්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වල උපදෙස් හා විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **(iii)** | ආදායම් වර්ගීකරණය කිරිමේ දී, රු. 1,930,440ක් වු පානීය නොවන ස්ප්‍රීතු ආදායමක් විදේශ මත්පැන් ආදායමක් ලෙසත්, රු. 931,500 ක් වු විදේශ මත්පැන් ආදායමක් ආනයනික මෙතනෝල් බදු ආදායමක් ලෙසත් රු.2,130,000 ක ස්ටිකර් ආදායමක් බලපත්‍ර ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආදායම් වර්ගීකරණය කිරිමේදී ප්‍රමාද දෝෂයකින් එලෙස සිදුවී ඇත. ඉදිරියේදී ආදායම් වර්ගීකරණය නිවැරදිව ගිණුම්ගත කිරිමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදි. | එක් එක් ආදායම් ප්‍රභවය අනුව අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන වර්ගීකරණය කර ගිණුම් ගත කල යුතු බව. |

**(ආ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මත්පැන් අපනයනය මත සුරාබදු මුදල් අවකරණය** 2019 දෙසැම්බර් 27 දිනැති අංක 2155/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුකූලව නිකුත් කරන ලද අංක 10/2019 දරන සුරාබදු නිවේදනයේ සඳහන් ස්වභාවය වෙනස් නොකරන ලද පානීය සහ විකිණීම සඳහා අදහස් කරන බෝතල්ගත කරන ලද මත්පැන් අපනයනය සම්බන්ධව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ බදු අවකරණ වාර්තාව අනුව නිෂ්පාදන ආයතන 03කට අදාළව අවස්ථා 26 ක දී මත්පැන් ලීටර 12,211,501ක් අපනයනය වෙනුවෙන් රු. 5,152,864,440ක් වූ සුරාබදු මුදල් අවකරණය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** | 2022 වර්ෂයට අදාළව නිෂ්පාදනාගාර විසින් දේශීයව නිපදවන මත්පැන් අපනයනය මත නිෂ්පාදන බදුවලින් අදාළ අවකරණයන් අඩු කිරීමෙන් පසු ශුද්ධ සුරාබදු ආදායම ගිණුම්ගත කර තිබුණු අතර සුරාබදු අවකරණ වටිනාකම වියදමක් ලෙස නිරූපණය කර නොතිබුණි. | බදු අවකරණ වටිනාකම සුරාබදු ආදායම් ශීර්ෂය යටතේම ආදායමින් හිලව් කිරීමක් කර පාද සටහන් මඟින් පෙන්නුම් කර ඇත | මත්පැන් අපනයනයට අදාළව බදු අවකරණය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු විසින් ලබා දී ඇති විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |
| **(ii)** | අවකරණ සම්බන්ධ නිශ්චිත ගිණුම් ක්‍රමවේදය සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා හඳුනා ගෙන නොතිබුණි. මේ තත්ත්වය මත සුරාබදු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් භාණ්ඩාගාර ගිණුම්වල ද මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය සම්බන්ධ තොරතුරු නිරූපණය වීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වා අවසන් තීරණයකට පැමිණි වහාම සුරාබදු අවකරණ සම්බන්ධ ගිණුම් තැබීම සිදු කෙරේ. | මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය සම්බන්ධ තොරතුරු ගිණුම් වල නිරූපණය විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | මත්පැන් නිෂ්පාදකයින් විසින් රජයට ගෙවිය යුතු සම්පූර්ණ බදු මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කර ඔවුන්ට ලබා දෙන බදු සහනය ආදායමින් ආපසු ගෙවීමක් ලෙස ගිණුම්ගත කළ යුතු බවත්, මුදල් රෙගුලාසි 118 අනුව ආදායමින් ආපසු ගෙවීමේ බලය සුරාබදු කොමසාරිස් ජනරාල්ට ලැබෙන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ගැනීම සුදුසු බවත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ආදායමින් ආපසු ගෙවීම සිදු කිරීම සඳහා අවශ්‍ය අක් මුදල් සපයා ගැනීමේ අපහසුතාවය හා මු.රෙ 118 අනුව කටයුතු කිරීම ප්‍රයෝගික ගැටළු පවතින හෙයින් ඒ සඳහා සුදුසු වැය ශීර්ෂයක් මඟින් ගෙවීම් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 118 හි විධි විධාන පරිදි කටයුතු කල යුතුය. |
| **(iv)** | අපනයනය කරනු ලබන මත්පැන්වලට අදාළ බදු මුදල් ආපසු ගෙවීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට සුදුසු වැය විෂයක් ලබා දී ඊට අවශ්‍ය ප්‍රතිපාදන මුදල් වෙන් කර දෙන ලෙස හා එම වැය විෂය මඟින් සුරාබදු අවකරණය ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් ආපසු ගෙවීම් සඳහා වැය විෂයක් යටතේ ප්‍රතිපාදන ලැබී නොතිබුණි. | අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ අතර, ගෙවීමේදී පවතින දුෂ්කරතා හේතුවෙන් දැනට පවතින ක්‍රමවේදය අනුගමනය කිරීමට තීරණය විය. | එම |

(ආ) **ස්ටිකර් ව්‍යාපෘතිය සඳහා ගෙවීම්**

| | | | |
|---|---|---|---|
| **(i)** | **ස්ටිකර් ව්‍යාපෘතිය යටතේ** ආරක්ෂිත ස්ටිකරයක් හා ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ පදනම මත ස්ටිකර් සහ සේවා සැපයුම සඳහා වූ කොන්ත්‍රාත්තුව විදේශීය පෞද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා **ගෙවීම් පරීක්ෂාවේ දී** දේශීය නිෂ්පාදිත මත්පැන් සඳහා **මුද්‍රිත ස්ටිකර්** 217,210,000 ක් සහ ආනයනය කල විදේශීය මත්පැන් සඳහා **මුද්‍රිත ස්ටිකර්** 12,016,135 ක් වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමට පිළිවෙලින් රු.494,921,349 ක් සහ රු.14,495,480 ක් ද ඩිජිටල් සලකුණු 375,500,000 ක් ද වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමට ගෙවිය යුතු ඇමරිකන් ඩොලර් 2,249,245 ක මුදලින් ඇ.ඩො. 500,000 ක් පමණක් නිරවුල් කර තිබුණි. ගෙවීම් අනුමත කිරිමේ දි සහ සහතික කිරීමේ දී අදාළ ගිවිසුම් ප්‍රකාර එකඟ වු සියලුම කාර්යයන් නිම වී තිබුණේ ද යන්න තහවුරු කර නොතිබුණි. | අදාළ දිනට ඇමරිකන් ඩොලර් 500,000 ක් පමණක් නිරවුල් කර තිබුණ ද මේ වන විට ඇ.ඩො. 2,118,374 ක් ගෙවා ඇත. ඇ.ඩො. 879,621 කට අදාල බිල්පත් නිරවුල් කිරීමට ඇත. ඩිජිටල් සලකුණු 500,500,000 ක් වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමට ඇමරිකන් ඩොලර් 2,997,995 ක මුදලින් මේ වන විට ඇමරිකන් ඩොලර් 2,118,374 ක් ගෙවා ඇති අතර ඇමරිකන් ඩොලර් 879,621 කට අදාල බිල්පත් නිරවුල් කිරීමට ඇත. | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු එකග වු විෂය පථය යටතේ ඇති සියලුම කාර්යයන්ගෙන් එක් එක් කාර්යයට අදාළ කාර්යය කොටස නිමකල බවට ලිඛිතව තහවුරු කර ගැනිම කල යුතු වේ. |
| (ii) | මත්පැන් නිෂ්පාදන සමාගම් වලින් එක් මුද්‍රිත ස්ටිකරයක් හා ඩිජිටල් සලකුණක් සඳහා අය කරනු ලබන රු. 2 ක මුදල ඉක්මවා කොන්ත්‍රාත් සමාගම වෙතින් ස්ටිකරයක් මිල දී ගැනීමට මුද්‍රිත ස්ටිකරයක් සඳහා රු. 2.27 ක් බැගින් ද ඩිජිටල් සලකුණක් සඳහා රු. 2.19 ක් බැගින් ද වැය වන බව නිරීක්ෂණය විය. | ඩොලරයේ අගය ශීඝ්‍ර ලෙස ඉහල යාම නිසා ආයතනය වෙත රු 2 ක මුදල ඉක්මවා ගෙවීම් කිරීමට සිදුව ඇත. ස්ටිකරයක් සඳහා අයකරනු ලබන රු 2 ක මුදල වැඩිකිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. තවද ආරක්ෂිත කළමනාකරණ කමිටුව වෙත ද ස්ටිකරයේ මිල වැඩි කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. | මිලදී ගැනීමේ පිරිවැය හා ස්ටිකර් අලෙවි අදායමේ දත්ත විශ්ලේෂණය කර රජයට අවාසිදායක නොවන අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කල යුතුය. |
| (iii) | ස්ටිකර් සඳහා විදේශ මුදලින් කොන්ත්‍රාත් සමාගමට ගෙවීමේ දී අමතරව බැංකු කොමිස් හා සේවා ගාස්තු ද සමඟ පිරිවැය තවදුරවත් වැඩි විය හැකි බැවින් ඉන් දෙපාර්තමේන්තුවට සිදු වන පාඩුව මඟ හරවා ගැනීම සඳහා අවධානය යොමු වී නොතිබුණි. | එම | එම |

**(ඇ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වෙත ලද ඇප තැම්පත් 04කට අදාළ එකතුව රු 363,250ක් වූ ඇප තැම්පත් මුදල අංක 6000-0-0-1-0-122 දරන ඇප තැම්පත් ගිණුමට ඇතුළත් වී නොතිබුණි. | මුදල් 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගත වී තිබුණ ද එම ආදායම් වලට අදාළ වාර්තා ප්‍රාදේශීය කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට ඇති දුෂ්කරතා හේතුවෙන් මෙම ආදායම් දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කිරීමට අපහසු වී ඇත. | ප්‍රාදේශීය කාර්යාල වෙතින් ආදායම් තොරතුරු ගෙන්වාගෙන ගිණුම් ගත කිරීමේ කටයුතු කල යුතුය. |

**(ඈ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 19 ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ 0007041628 ගිණුමට රැස්කර බැංකු ගත කර තිබුණු රු. 28,716,637 ක් මහා භාණ්ඩාගාරයට අඩුවෙන් පියවා තිබුණි. | වාර්තා ප්‍රාදේශීය කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට ඇති දුෂ්කරතා හේතුවෙන් මෙම ආදායම් දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කිරීමට අපහසු වී ඇත. | භාණ්ඩාගාර චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුරාබදු ආදායමට අවස්ථා 04ක දී ගැලපීම් කර තිබූ රු.4,345,717කට අදාළ ජර්නල් සටහන් සහ ආදායමින් ආපසු ගෙවීම් කර තිබුණු රු.1,836,572 ක මුදලක් සඳහා අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | ජර්නල් සටහන් මගින් පෙන්නුම් කිරීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වමි. රු1,836,573 ක මුදල භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව ආපසු ගෙවන ලද ගෙවීම් වේ. | ගිණුම් වල ගැලපීම් වලට අදාළ ජර්නල් සටහන් සහ අදාළ සාක්ෂි මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ගත සුරාබදු ආදායම රු. බිලියන 180 ක් වූ අතර එය නැවත රු. බිලියන 185 දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. බිලියන 165 ක බදු ආදායමක් රැස්කර තිබුණි. එය මුල් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේ දී සියයට 91.7 ක් ද සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 89.2 ක ප්‍රතිශතයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙවන හා තෙවන කාර්තු තුළ ආදායම සියයට 05 සිට සියයට 15 දක්වා පරාසයකින් අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය. | සමාජ හා දේශපාලන අර්බුදකාරී තත්වය, මත බලපත්‍ර ස්ථාන වසා තැබීම, ඉන්ධන හිඟය නිසා ඇතිවූ ප්‍රවාහන දුෂ්කරතා, සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීම, ආදී කරුණු වල බලපෑම මත දෙවන හා තුන්වන කාර්තු වල අපේක්ෂිත ආදායම් ඉලක්ක වලට ළඟාවීමට නොහැකි විය. | මනා අධීක්ෂණයක් ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ඇස්තමේන්තු සංශෝධනය වී තිබුණ ද, ඒ අනුව බලපත්‍රලත් සැර මත්පැන් නිෂ්පාදනාගාරවල ආදායම් ඉලක්ක සංශෝධනය වී නොතිබුණි. එක් එක් සැර මත්පැන් නිෂ්පාදනාගාරවල මුල් ආදායම් ඉලක්ක හා සමාලෝචිත වර්ෂයේ මුල් මාස 09 තුළ අය වූ ආදායම් පරීක්ෂාවේ දී ආයතන 04කින් පමණක් සියයට 03 සිට සියයට 64 දක්වා පරාසයකින් ලබා දී තිබුණු ඉලක්කගත ආදායම් සීමාව ඉක්වා තිබුණි. සැර මත්පැන් නිෂ්පාදන ආයතනවලින් ඉලක්ක සපුරා නොගත් ප්‍රතිශතය සියයට 08 සිට සියයට 100 ත් අතර පරාසයක තිබුණි. | පරිපාක ස්ප්‍රීතු හිඟය, මත්පැන් මිළ ඉහල දැමීම ඉල්ලුම අඩු වීම, නිෂ්පාදනාගාර සම්බන්ධ ආර්ථික ගැටළු, මත්පැන් රසකාරක ආනයනයේදී ඇතිවූ ගැටලු , නිෂ්පාදනයන්ගේ පිරිවැය ඉහල යාම විවිධ නඩත්තු කටයුතු මත නිෂ්පාදනාගාර වසා තැබීම, ආදායම් ඉලක්ක වෙත ලගා නොවීමට බලපා ඇත. | සැර මත්පැන් නිෂ්පාදන ආයතන හා ධාන්‍ය මත්පැන් නිෂ්පාදන ආයතන ඇතුළු අනෙකුත් ආදායම් ප්‍රභවයන්ට අදාළ අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බලපත්‍රලත් සැර මත්පැන් නිෂ්පාදනාගාර 20 ක් සම්බන්ධයෙන් මුල් මාස 09ක කාලච්ඡේදයට අදාළව තොරතුරු පරීක්ෂාවේ දී සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 18ක් මුළු ආදායමට සියයට 68.80 ක දායකත්වයක් දක්වා තිබුණු අතර සියයට 89.19ක දායකත්වයක් සමාගම් 03 ක් මත රැඳී තිබෙන බව නිරීක්ෂණය විය. තව ද ධාන්‍ය මත්පැන් නිෂ්පාදන සමාගම් 2ක් විසින් සුරාබදු ආදායමට සියයට 31.20 ක දායකත්වයක් දක්වා තිබුණි.<br>සමාලෝචිත වර්ෂයේ විදේශීය මත්පැන් ආනයනයන් පරීක්ෂාවේදී ආනයනකරුවන් ලෙස ලියාපදිංචි ආයතන 33 කින් 13 දෙනෙකු අවස්ථා 133 කදී ආනයන බදු ලෙස රු.172,928,367 ක් අය වී තිබුණු | මෙම සමාගම් වල නිෂ්පාදන ගුණාත්මක බව හා ජනප්‍රියත්වයත්, ඉහල මූල්‍ය ආයෝජනය මත මත්පැන් වෙළඳපල තුල වැඩි දායකත්වයට හේතුවේ. සෙසු මත්පැන් සමාගම් 15 හි දායකත්වය අඩු වීමට පාරිභෝගික ආකර්ෂණය සහ මූල්‍ය ආයෝජන සාපේක්ෂකව අඩු මට්ටමක පැවතීම, වෙළඳපල වෙනස්වීම් සඳහා සංවේදී වන මට්ටමේ පර්යේෂණ /අත්හදා බැලීම් සිදු නොවීම හේතු වී ඇත. නිෂ්පාදන වල සාපේක්ෂකව අඩු මිළ, අන්තර්ජාතික මට්ටමේ නාමයන් හා ඉහල තාක්ෂණය, මහා පරිමාණ කර්මාන්තයක් වීම, ධාන්‍ය මත්පැන් නිෂ්පාදන ආයතන වල දායකත්වයට හේතු වී ඇත. | මත්පැන් නිෂ්පාදන බදු ආදායම හා එක් එක් නිෂ්පාදන සමාගමේ වෙළඳපල කොටස, එමඟින් සුරාබදු ආදායමට වන දායකත්වය සම්බන්ධ තොරතුරු විශ්ලේෂණය කරමින් |

| | | | |
|---|---|---|---|
| | අතර. ඉන්අවස්ථා 39 ක දී රු.120,151,976 ක් බදු ආදායමක් අයවී තිබුණේ ආනයන වෙළඳපොළ කොටසින් සියයට 69 ක් නියෝජනය කල ආයතන දෙකකින් විය | | විග්‍රහත්මක සමාලෝචනයක් ක්‍රියාත්මක කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ පොල් රා බෝතල් නිෂ්පාදනාගාර 16 කින් එක් නිෂ්පාදනාගාරයක් අක්‍රියව පැවති අතර ඉතිරි නිෂ්පාදනාගාර වලින් රු. 525,726,800 ක් හා තල් රා බෝතල් නිෂ්පාදනාගාර 29 න් 05 ක් අක්‍රීය තත්ත්වයේ පැවති අතර ඉතිරි නිෂ්පාදනාගාර වලින් රු 46,597,081 ක ආදායමක් ද උපයා තිබුණි. තවද පොල් රා බෝතල් නිෂ්පාදනාගාර 03 ක හා තල් රා බෝතල් නිෂ්පාදනාගාර 10 ක මාස 03ත් මාස 10ත් අතර කාල පරාසයක ආදායම් ලැබී නොතිබුණි. අක්‍රිය ආයතන සහ අඩු ආදායමක් අය වී තිබූ ආයතන පිළිබඳව පසු විපරමක් ද සිදු වී නොතිබුණි. | නිෂ්පාදනයන් අලෙවි නොවීම මත ඇතැම් මාසවල රා බෝතල් නිෂ්පාදනය නොකිරීම. රා බෝතල් නිෂ්පාදනාගාර වෙත ප්‍රමාණවත් පරිදි මහ රා නොලැබීම ඒ සඳහා බලපා ඇත. | ශ්‍රී ලංකාවට ආවේනික කර්මාන්තයක් වූ පොල් රා හා තල් රා නිෂ්පාදන කර්මාන්තය මුහුණදෙන ගැටළු හඳුනාගැනීම සහ කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා සුරාබදු නිවේදන 991 අනුව සැර මත්පැන් නිෂ්පාදන ආයතන 23කින් 07කට අදාළව රු. 11,237,675 ක් සුරාබදු නිවේදනය යටතේ ඉඩ දෙන සීමාව ඉක්මවා සිදු වන අපතයන් වෙනුවෙන් බදු මුදල් අය වී තිබුණු අතර සැර මත්පැන් නිෂ්පාදන ආයතන 17 ක අපතය සඳහා කිසිදු බදු මුදලක් අය වී නොතිබුණි. මේ අනුව නිෂ්පාදන ක්‍රියාවලියේ දී සිදුවන අපතයන් සඳහා ඉඩදෙන සීමාව ඉක්මවා සිදුවන අසාමාන්‍ය අපතයන් සඳහා සුරාබදු මුදල් අය කර ගැනීම සම්බන්ධ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන බවට විගණනයට තහවුරු නොවුණි. ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ එක් නිෂ්පාදනාගාරයකින් ඉඩදෙන සීමාව ඉක්මවා සිදු වී තිබූ සංශුද්ධ මධ්‍යසාර ලීටර් 8,307.2 කට අදාළව අසාමාන්‍ය අපතයන් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා බදු මුදල් අය වී නොතිබුණි. | ඇතැම් නිෂ්පාදනාගාර සමාලෝචිත වර්ෂය සඳහා අපතය මත බදු ගෙවීම් සිදුකොට ඇත. මෙතෙක් අපතය මත බදු අයකරගෙන නොමැති නිෂ්පාදනාගාර/ගුදම්/ස්කාගාරවල අදාල අයකිරීම් සිදුකිරීමට ඉදිරියේදී ක්‍රියා කරනු ඇත. | ඉඩදෙන සීමාව ඉක්මවා සිදුවන අපතයන් සඳහා සුරාබදු මුදල් අය කර ගැනීම සම්බන්ධ නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ලිපිගොණු පරික්ෂාවේ දී සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2022 සැප්තැම්බර් මස නැවත ලේගර ගත කරනු ලැබූ මත්පැන් සඳහා අය කර ගත් බදු මුදල් නැවත ගෙවීම මැයින් නිකුත් කළ ලිපිය මඟින් එක් මත්පැන් නිෂ්පාදනාගාරයක් සඳහා නැවත ලේගරගත කරනු ලැබූ මත්පැන් සංශුද්ධ මධ්‍යසාර ලීටර 9,015 ක් වෙනුවෙන් අනුමැතිය ලබා දීමට බලපාන ලද කරුණු දැක්වීමකින් තොරව අය කර ඇති රු. 30,763,726 ක් වූ සුරාබදු ආදායමක් අවකරණය කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදියි. | එම |
| (උ) | බීඩි කර්මාන්තයට අදාළව බදු අය කිරීම.<br>පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | 1999 අංක 8 දරන දුම්කොල බදු පනත යටතේ නිෂ්පාදනය කරනු ලබන සෑම බීඩියක් සහ සුරුට්ටුවක් සඳහාම බද්දක් පැනවිය යුතු වුවද , අදාළ බදු අය කිරීමේ නිවේදනය නිකුත් වී තිබුනේ 2022 දෙසැම්බර් 31 දින ඉදිරි වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය දක්වාම බීඩි සුරුට්ටු කර්මාන්තයෙන් බදු ආදායම් අහිමි වී තිබුණි. | 2023 අයවැය යෝජනා අනුව 2022.12.31 වන දින ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම බීඩියක් සඳහාම රුපියල් දෙකක අනුප්‍රමාණයට දුම්කොල බද්දක් අයකරන ලෙස දන්වමින් 1999 අංක 8 දරන දුම්කොල බදු පනත යටතේ නිවේදනයක් නිකුත් කර ඇත. | 1999 අංක 8 දරන දුම්කොල බදු පනත යටතේ නිකුත් කල නිවේදනය ප්‍රකාරව කටයුතු කල යුතුව තිබුණි. |
| (ii) | සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් බීඩි/සිගරට්/සුරුට්ටු සම්බන්ධයෙන් ලියාපදිංචි සහතික 774 ක් නිකුත් කර තිබුණ ද 2022.03.31 දින වන විට ලියාපදිංචිය අලුත් කර ගෙන තිබූ ආයතන සංඛ්‍යාව 509 ක් පමණක් බව නිරීක්ෂණය වූ අතර බලපත්‍රලාභීන් 265 කු ලියාපදිංචිය අලුත් කර නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන්නේ ද යන්න සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පසු විපරමක් සිදු කර නොතිබුණි. | සක්‍රීය මට්ටමේ සිටින ආයතන 585 ක් පමණ පවතී. ලියාපදිංචි සහතිකයේ කාලය ඉකුත් වී ඇති නමුත් මේ වන තෙක් ලියාපදිංචි සහතිකයේ කාලය දීර්ඝ කර නොගත් සියලු බීඩි හෝ සුරුට්ටු නිෂ්පාදන ආයතන සම්බන්ධයෙන් නිසි පරීක්ෂාවක් සිදුකරන ලෙස සියලු සහකාර සුරාබදු කොමසාරිස්වරුන්, සියලු සුරාබදු අධිකාරිවරුන් හා සියලු සුරාබදු ස්ථානාධිපතිවරුන් වෙත උපදෙස් ලබා දී ඇත. | ලියාපදිංචිය සහතික අලුත් කරගෙන නොතිබූ ආයතන සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කල යුතුය. |
| (ඌ) | හිඟ ආදායම් - සුරා බදු<br>පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මුදල් රෙගුලාසි 176(1) යටතේ මු. රෙ. 128(2)(ඇ) ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ ආදායම් වාර්තාවට අනුව මත්පැන් නිෂ්පාදන ආයතන වෙතින් රු. 5,491,066,488 ක් ද, රා නිෂ්පාදන ආයතන වෙතින් රු. 7,244,372 ක් ද, ස්කාගාර වෙතින් රු. 16,573,335 ක් ද වශයෙන් මුළු හිඟ බදු හා ප්‍රමාද ගාස්තු ලෙස එකතුව රු.5,514.884,195 ක් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත අය විය යුතුව පැවතිණි. එය 2021 දෙසැම්බර් 31 දිනට සඳහා වූ රු. 4,550,673,483 ක හිඟ ආදායම සමඟ සැසඳීමේ දී | අයවිය යුතුව තිබූ මුදලින් 2023.05.15 වන දින වන විට රු.497,337,372 ක මුදලක් හිඟ බදු හා අධිභාර මුදල් වශයෙන් අයකර ඇත.<br>රා නිෂ්පාදනාගාර වෙතින් 2022.12.31 දිනට අයවිය යුතුව තිබූ රු.7,244,372 ක හිඟ බදු මුදල හා ඒ මත අයවිය යුතු අධිභාර මුදල් අයවී ඇත.<br>ස්කාගාර වෙතින් අයවිය යුතුව තිබූ රු.16,573,335 ක මුදලින් රු.1,991,075 ක මුදලක් අයවී ඇත. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව හිඟ බදු හා ප්‍රමාද ගාස්තු නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.964,210,712 ක වැඩි වීමක් හෙවත් එය සියයට 21.18 ක වැඩි වීමක් බව නිරික්ෂණය විය. තව ද මෙම හිඟ බදු වැඩි වීම් සඳහා මුලික හිඟ බදු මුදල් අය නොවීම හේතුවෙන් ඒ සඳහා ගණනය කළ ප්‍රමාද ගාස්තු ද බලපා තිබුණි. | | |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා නිෂ්පාදන/ස්කාගාර ආයතන 04 කට අදාළව එකතුව රු 2,389,692,257 ක ආදායමක් වසර 5 කට වැඩි කාලයක් තුළ අය කර ගැනීමට නොහැකි වී තිබුණි. ඉන් ආයතන 03 කට අදාළව නඩු පැවරීමට අවශ්‍ය මුලික කරුණු කෙටුම්පත් කරන අවස්ථාවේ දී හිඟ සුරාබදු හා ප්‍රමාද ගාස්තු ගෙවීම පිළිබඳ එකඟතාවය ඇති කර ගෙන තිබුණ ද, අදාළ ආයතනයන් විසින් එම එකඟතාවයන් කඩ කර හිඟ බදු හා ප්‍රමාද ගාස්තු ගෙවීම පැහැර හැර තිබුණි. | එක් ආයතනයක් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුවේ නීති අංශය වෙත ලිපිගොනු යොමු කර ඇත. තවත් සමාගමක ගෙවිය යුතු හිඟ බදු හා අධිභාර මුදල් සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවන බවත්, ස්වාධින කමිටුවක් පත්කර පරීක්ෂණයක් ඉල්ලා කමිටුව පත්කරන ලද අතර. කමිටුවේ අවසාන තීරණ වාර්තාව අනුව අයකිරීමට කටයුතු කරන බව.<br>තවත් සමාගමක පවතින නඩුවේ තීන්දුව අනුව හිඟ බදු අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | එම |
| (iii) | නිෂ්පාදන කටයුතු අත්හිටුවා ඇති එක් සැර මත්පැන් නිෂ්පාදන සමාගමක් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා 2021 ජුනි 23 දින ගිවිසුම් ගත වී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් නැවත නිෂ්පාදන අත්හිටුවීමට කටයුතු කර තිබුණි. නැවතත් සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමැතිය දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම සමාගමෙන් අය විය යුතු හිඟ බදු මුදල රු. 1,292,877,138 ක් සහ ප්‍රමාද ගාස්තු රු. 1,456,079,040 ක් පැවතුණි. ගිවිසගත් පරිදි හිග වාරික ගෙවීම පැහැර ඇති බව නිරීක්ෂණය විය. | හිඟ බදු මුදල් හා ප්‍රමාද ගාස්තු වලින් එකඟ වු ගිවිසුම් අනුව වාරික 2 ක් ගෙවා ඇත. තවදුරටත් වාරික 7 ක් හිඟ වශයෙන් පවති. මෙම හිඟ වාරික මුදල් ගෙවන ලෙස ලිපි මඟින් දැනුම් දී, අවස්ථා කිහිපයකදීම එම ආයතනය සමඟ මෙම හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇත. | නෛතික විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |
| (එ) | හිඟ දුම්කොළ බදු ආදායම් | | |
| (i) | ආයතන 03 ක් විසින් ලියාපදිංචි සහතික ලබා නොගෙන දුම්කොළ ආනයනය කිරීමට කටයුතු කර තිබුණු බව සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රේගුව වෙත කරන ලද ලිඛිත විමසීම්වල දී ලබා ගන්නා ලද තොරතුරු අනුව හඳුනා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ආයතන 03 න් එකතුව රු.9,836,528 ක බදු මුදලක් හිඟව පැවතුණි. | එක් ආයතනයකින් රු. 560,550 ක මුදලක් රු.93,500 බැගින් සමාන වාරික 06 කින් ගෙවීමට නියමිතව ඇත. රු. 5,429,350 ක් නියෝජනය වන තවත් ආයතනයක් මේ වන තෙක් ගිවිසුම් ගත වීම හෝ මුදල් ගෙවීමට කැමැත්ත පළ කර නොමැති අතර නීති අංශයේ උපදෙස් මත කටයුතු කිරීමට නියමිතය. හිඟ බදු මුදල වු රු. 3,659,128 ක් පවතින තවත් ආයතනයක සියළු හිමි කරුවන් විදේශ ගත වී ඇති බව වාර්තා කර ඇත. නීතිපති උපදෙස් අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිතය. | හිඟ බදු මුදල් ගිවිසුම් ප්‍රකාරව එකඟ වු වාරික අනුව අය කර ගැනීමට කටයුතු කිරිම හා ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2009 ඔක්තෝම්බර් 26 දින ගැසට් පත්‍රයේ පල කරන ලද 2009 අංක 01 දරන දුම්කොළ බදු (සාමාන්‍ය) නියෝගයෙහි 06 වැනි වගන්තිය ප්‍රකාරව ලියාපදිංචිය දරන්නෙක් විසින් දුම්කොල බදු පනත, සුරාබදු ආඥා පනත, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ යම් බද්දක් ගෙවීම පැහැර හරින විට දී ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීම, අත්හිටවනු ලැබීම හෝ දඩ මුදලක් නියම කිරීම සිදු කරනු ලැබිය හැකි වුව ද ඒ පිළිබඳව සලකා බැලීමකින් තොරව මෙම ආයතන 03 සඳහා පෙර වර්ෂවල ලියාපදිංචි සහතික අළුත්කර තිබුණි. | පනත ක්‍රියාත්මක වු මුල් අවධිය තුල මෙම දෙපාර්තමේන්තුවෙන් ආනයනකරුවන් ලියාපදිංචි සහතික ලබා නොගෙන දුම්කොළ ආනයනය කිරීමට කටයුතු කර තිබු අතර ආනයනකරුවන් තිදෙනෙකු අදාල බදු මුදල් නොගෙවීම හේතුවෙන් ලියාපදිංචි සහතික නිකුත් කිරීම අත්හිටුවා ඇත. නමුත් අදාල හිඟ බදු මුදල් ගෙවීමට එකඟ වූ ගිවිසුම් ප්‍රකාරව යම් අවස්ථා වලදී අදාල ලියාපදිංචි සහතික අළුත් කරන ලදි. | දුම්කොළ බදු (සාමාන්‍ය) නියෝගයෙහි 06 වැනි වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා රු 376,500,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් එකතුව රු. 342,448,827 ක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය එකතුව රු 34,051,173 ක් විය. එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් 36 ත් අතර පරාසයක විය. | ජා.අ.ව.03/2022 මඟින් රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා කටයුතු කිරීම, වර්ෂය පුරා පැවති ඉන්ධන සීමාවීම කොවිඩ් වසංගතය, භාණ්ඩ හිඟතාවය ප්‍රසම්පාදනය කිරීමට නොහැකි වීම, අමුද්‍රව්‍ය හිඟ වීම, අඛණ්ඩව විදුලි සැපයුම නොලැබී යාම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | දෙපාර්තමේන්තුවේ දැක්ම ,මෙහෙවර ප්‍රකාරව අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන ඵලදායි ලෙස හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූලධන වැය විෂයයන් 05 ක් සඳහා රු. 96,500,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණ ද, ඉන් එකතුව රු.30,419,753 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ත් 56 ත් අතර පරාසයක පැවතුණි. | එම | දෙපාර්තමේන්තුවේ දැක්ම ,මෙහෙවර ප්‍රකාරව අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා යටිතල පහසුකම් යටතේ වූ මූලධන ප්‍රතිපාදන ඵලදායි ලෙස හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>XXIV පරිච්ඡේදය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛ විධිවිධාන<br>2019 ජුනි 27 දිනැති අංක 05/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ඉ) ඡේදය | 6,305,135 | මිය ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන්, සේවයෙන් පහකළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් , විශ්‍රාම ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 18 දෙනෙකුගෙන් එකතුව රු. 6,305,135 ක ණය ශේෂයක් අය විය යුතු පැවතුණි. ඉන් මියගිය එක් නිලධාරියෙකුගේ හා විශ්‍රාම ගිය එක් නිලධාරියෙකුගේ ලැබිය යුතු ශේෂය එකතුව රු. 401,990 ක් වසර 2-3 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි. තව ද සේවයෙන් පහකළ නිලධාරීන් 05 ස් දෙනෙකුගේ හා වැඩ තහනම් කළ නිලධාරීන් | නිලධාරීන් දෙදෙනෙකුගේ ලිපිගොනු 02ක් අස්ථානගත වූ ණය ශේෂයන් කපා හැරීම නිර්දේශ කර අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කිරීමත් එක් අයෙකුට ණය මුදල් ගෙවන ලෙස දැනුම් දීමත් ණය කරුවන් දෙදෙනෙකුගේ ඇපකරුවන්ගෙන් අය කිරීමත් ඉතිරි දෙදෙනාට විරුද්ධව නීති මඟින් කටයුතු කිරීමත් අල්ලස් චෝදනා ඇති එක් නිලධාරියෙකුට නඩු තීන්දුව අනුව ක්‍රියාමාර්ග ගැනීමටත් නියමිතය. | ආයතන සංග්‍රහය සහ අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.628,329 ක් වසර 5 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | | |
| (ii) | අංක 10/2019 දරන සුරාබදු නිවේදනයේ නියමයට අනුව සුරාබදු ආඥපනතේ 12 වැනි වගන්තිය | මත්පැන් අපනයනයට අදාළ සුරාබදු අවකරණ සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පිළිගත හැකි ඇපකරයක් හෝ බැංකු ඇපයක් සැපයිය යුතු වුව ද, ආයතන 03 ක් විසින් අපනයනයේ දී තබා තිබූ ඇප අපනයන වටිනාකම ආවරණය නොවුණි. | අදාළ බැංකු ඇපය වැඩි කර ඉදිරිපත් කරන ලෙස අදාළ සමාගම් දැනුවත් කර ඇත. | අංක 10/2019 දරන සුරාබදු නිවේදනයේ නියමයට අනුව සුරාබදු ආඥපනතේ 12 වැනි වගන්තිය අනුව කටයුතු කල යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 6000/0-0-18-0-119 දරන හා අංක 6000/0-0-16-0-126 දරන තැන්පත් ගිණුම් 02 හි පිළිවෙලින් එකතුව රු.3,470,567 තැන්පතු 02 හා එකතුව රු. 1,851,627 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් වසර 2 ක් ඉක්මවා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අංක 6000/0-0-18-0-119 දරන තැන්පත් ගිණුමට අදාළව තැන්පතු 02 කට අදාළව එකතුව රු.3,470,567 ක් නිරවුල් කිරීමට කටයුතු සිදු කරමින් බව සහ<br>අංක 6000/0-0-16-0-126 දරන තැන්පත් ගිණුමට අදාළව තැන්පතු 03 ක එකතුව රු. 1,851,627 නිරවුල් කිරීමට කටයුතු සිදු කරමින් බව | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අංක 6000-0-0-1-0-122 දරන ඇප තැන්පතු ගිණුමේ රු.75,689,654 ක් වූ තැන්පතු 1,889 කින් තවදුරටත් තැන්පත් කළ පාර්ශව විසින් හිමිකම් නොපාන හා තැන්පතු වශයෙන් තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන වසර 02 ඉක්මවා ඇති තැන්පතු හඳුනා ගෙන රජයේ ආදායමට බැර කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | අංක 6000-0-0-1-0-122 දරණ ඇප තැන්පතු ගිණුමේ 2000 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වසර 02 ඉක්මවා ඇති රු.75,689,654 ඇප තැන්පතු මුදල් නිරවුල් කිරීමට ඉදිරියේ දී කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කළ පාර්ශව විසින් හිමිකම් නොපාන හා තැන්පතු වශයෙන් තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන තැන්පතු හඳුනා ගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතුය. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි වූ උපලේඛන **viii** හි දෙපාර්තමේන්තුව විවෘත කළ සියළුම බැංකු ගිණුම්වල සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට තත්ත්වය දැක්විය යුතු වුවද ආදායම් රැස්කිරීමට අදාළව ලංකා බැංකුවේ පවත්වාගෙන ගොස් තිබුණු බැංකු ගිණුම හා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.13,445,283 ක් වූ ශේෂය පිළිබඳ තොරතුරු දක්වා නොතිබුණි. | හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි වූ උපලේඛන **viii** හි සියළුම බැංකු ගිණුම්වල වර්ෂයේ අවසාන දිනට තත්ත්වය දැක්විය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

දැක්ම හා මෙහෙවර සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණ සඳහන් කරන්න.

**දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුරාබදු දෙපාර්තමේන්තුවේ වූ මත්පැන් හා දුම්කොළ කර්මාන්තය විධිමත්ව නියාමනය කිරීම තුළින් රාජ්‍ය ආදායම වර්ධනය කිරීම සඳහා කැප වූ වඩාත්ම ගෞරවනීය හා වගකිව යුතු රාජ්‍ය ආයතනය වීම යන දැක්ම සඳහා කරුණු 06 ක් යටතේ මෙහෙවර දක්වා | අවදානම් කළමණාකරණ පද්ධතිය ස්ථාපිත ,රා සහ සකේ නිෂ්පාදන කර්මාන්තයට ප්‍රමිත ස්ථාපිත කිරීම හා සුරාබදු රසායනාගාරය ක්‍රියාත්මක වීම | අවදානම් කළමණාකරණ පද්ධතිය, ආදායම් කළමණාකරණ පද්ධතින් හා රා සහ සකේ නිෂ්පාදන කර්මාන්තයට ප්‍රමිත ස්ථාපිත |

| | | |
|---|---|---|
| තිබුණු අතර අරමුණු 12 ක් ඉටුකිරිම සඳහා වූ කාර්යයන් 09 ක් අගයයන් 10 ක් හදුනාගෙන තිබුණ ද අවදානම් කළමණාකරණ පද්ධතිය ස්ථාපිත නොවීම,රා සහ සකේ නිෂ්පාදන කර්මාන්තයට ප්‍රමිත ස්ථාපිත නොවීම, සුරාබදු රසායනාගාරය ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය,ආදායම් කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමේ ප්‍රමාදය අපේක්ෂිත දැක්ම , මෙහෙවර හා කාර්යභාරය ඉටුකිරිම කෙරෙහි අහිත කර ලෙස බලපෑමක් සිදු වී තිබුණි. | 2023 වර්ෂයේ දී කඩිනමින් ඉටුකිරීමට අපේක්ෂිතය. | කිරීම, සුරාබදු රසායනාගාරය ස්ථාපිත කිරීම. |

**3.2 සැලැසුම් කිරීම**

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන්වලට අදාළව සැර මත්පැන් හා ධාන්‍ය මත්පැන් නිෂ්පාදනයට අදාළව නිෂ්පාදන ආයතනවලට පමණක් ඉලක්ක ලබා දී තිබුණු අතර අනෙකුත් ආදායම් ප්‍රභවයන් 06 ක් සඳහා එසේ ඉලක්ක සැලසුම් කර නොතිබුණි. | ඉදිරියේ දී අනෙකුත් ආදායම් ප්‍රභවයන්ට අදාලව සුරාබදු ආදායම් ඉලක්ක වෙන් වෙන් ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ආදායම් ප්‍රභවයන්ට අදාළ ඉලක්ක ලබා දිය යුතුය. |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) නමින් වූ මෙම පද්ධතිය නව ප්‍රතිසංස්කරණයෙන් යුතු පරිගණක තොරතුරු පද්ධතියක් ක්‍රියාවට නැංවීමේ කටයුතු 2020 දෙසැම්බර් සිට ආරම්භ කර ක්‍රියාකාරී ක්ෂේත්‍ර 15කින් ද, අධීක්ෂණය සහ ඇගයීම් මොඩියුල 3 කින් ද, සහයක මොඩියුල 12 කින් ද සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ලේඛනයේ කෙටුම්පත 2022 දෙසැම්බර් 13 දින මුදල් අමාත්‍යාංශයේ තොරතුරු කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඔවුන්ගේ නිරීක්‍ෂණ සමඟ | අමාත්‍යාංශයේ උපදෙස් මත එය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගන්නා ලද නමුත් මේ වනතෙක් එම කෙටුම්පත සඳහා ඔවුන්ගේ ලිඛිත අදහස් හෝ යෝජනා සහිත SRS ලියැවිල්ල අප දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත. මූලික ප්‍රසම්පාදන තාක්‍ෂණ කමිටුවක් පත් කර ඇත. මාර්ගගත ක්‍රමය ඔස්සේ බලපත්‍රධාරීන් නැවත ලියාපදිංචි කිරීම හා ඉලෙක්ට්‍රොනික් ක්‍රමයට ගෙවීම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කිරීම. මොරටුව විශ්ව විද්‍යාලය මඟින් | යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

වැඩි දියුණු කිරීම සඳහා යොමු කර තිබුණි. මෘදුකාංග පද්ධති වල සවිස්තරාත්මක අවශ්‍යතා පිරිවිතර සකස් කිරීම ප්‍රමාද වීම. අමාත්‍යාංශයේ විශේෂඥ සේවාව අඛණ්ඩව නොලැබීම සහ යෝජිත උපදේශන සේවාවට අදාළ මූල්‍යමය යෝජනා සඳහා වූ අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම ආදී හේතුන් මත මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා සේවාදායකයෙකු සපයා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 100 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) **ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය**

බදු හෝ තීරු බදු නොගෙවන ලද මත්පැන් භාවිතය අවම කිරීම, සුරාබදු ආදායම තවදුරටත් සුරක්ෂිත කිරීම සහ ව්‍යාජ මත්පැන් වැලැක්වීම මූලික අරමුණ කරගෙන 2017 ඔක්තෝබර් 17 දිනැති අමාත්‍ය මණ්ඩලය අනුමැතිය අනුව ආරක්ෂිත ස්ටිකරයක් හා ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක් ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ පදනම මත ස්ටිකර් සහ සේවා සැපයුම සඳහා වූ කොන්ත්‍රාත්තුව ඉන්දියානු කොන්ත්‍රාත් සමාගමට ප්‍රදානය කර වසර 05ක් දක්වා 2018 සැප්තැම්බර් 21 දින සමාගම සමඟ ගිවිසුම්ගත වී තිබුණි.
ආනයනික මත්පැන් සඳහා 2019 ජුලි 20 දින සිට ක්‍රියාත්මක වී තිබූ අතර දේශීය නිෂ්පාදිත මත්පැන් සඳහා 2019අගෝස්තු 20 දින සිට ස්ටිකර් ඇලවීම ආරම්භ කළ යුතුව තිබුණ ද ප්‍රමාද වී 2022 ජනවාරි 03 දින සිට ක්‍රියාත්මත වී තිබුණි. මත්පැන් නිෂ්පාදන ආයතන 08 ක් සඳහා ඩිජිටල් සලකුණ ද අනෙකුත් නිෂ්පාදන ආයතන මුද්‍රිත ස්ටිකර් ඇලවීම ක්‍රියාත්මක වූ අතර, වෙළඳපොලේ පවතින මත්පැන් තොග සඳහා ආරක්ෂිත ස්ටිකර් ඇලවීම 2022 අප්‍රේල් මස 01 වන දිනට පෙර ලෙස සංශෝධනය වී ක්‍රියාත්මක වී තිබුණි. ස්ටිකර් ආදායමට අදාළ ආදායම් වාර්තා හා මාසික ගිණුම් සාරාංශය අනුව 2021 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා දේශීය සහ විදේශීය මත්පැන් සඳහා භාවිත කිරීමට මුද්‍රිත ස්ටිකර් සහ ඩිජිටල් සලකුණු 555,371,052 ක ප්‍රමාණයක් නිකුත් කර තිබූ අතර, රු. 1,155,016,308 ක ආදායමක් උපයා තිබුණි. සුරාබදු නිවේදන 07/2021 විධිවිධාන මාස 06 ක කාලයකට පෙර දැනුම් දිය යුතු වුව ද, නිෂ්පාදන ආයතන 03 ක ඩිජිටල් තාක්ෂණය ක්‍රියාත්මක වී ඉතා කෙටි කාලයකින් ආරක්ෂිත ස්ටිකර් ඇලවීමේ ක්‍රමවේදයට අනුගමනයට අනුමැතිය දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

උපදේශන සේවාව ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. රටෙහි පැවති අයහපත් වාතාවරණය හමුවේ සැලසුම් කළ පරිදි මෘදුකාංග සංවර්ධනයක් 2022 වර්ෂයේදී සිදු නොවුණි.

සැපයුම් දාම නියාමන අංශයේ වාර්තාවලට අනුකූලව 2021 දෙසැම්බර් මස හා 2022 සම්පූර්ණ වර්ෂය තුළ දේශීය නිෂ්පාදිත මත්පැන් වල ඇලවීම සඳහා මුද්‍රිත ස්ටිකර් (Paper Base) හා ඩිජිටල් සළකුණු 551,615,000 ක ප්‍රමාණයක් නිෂ්පාදනාගාර වෙත නිකුත් කර තිබූ අතර 2022 සම්පූර්ණ වර්ෂය තුළ ආනයනික විදේශීය මත්පැන් වල ඇලවීම සඳහා අංකිත ස්ටිකර් 3,756,052 ක ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. මේ අනුව පොදුවේ මුළු මුද්‍රිත ස්ටිකර් හා ඩිජිටල් සළකුණු 555,371,052ක ප්‍රමාණයක් නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර ඉන් රු.1,110,742,104 ක ආදායමක් උපයා තිබුණි.

| | | | |
|---|---|---|---|
| (i) | භාවිත කරන ලද ස්ටිකර්වලට අදාළව නව නිර්මාණ සැලැස්මක් නිර්මාණය කිරීම සම්බන්ධව පසු විපරමක් වාර්තා නොවීම, කොන්ත්‍රාත් සමාගම සමහ පවතින ගිවිසුම 2023 සැප්තැම්බර් මස අවසන් වන බැවින් ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යෑම සම්බන්ධව තාක්ෂණික හා කාර්මික දෝෂයන් නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස දැනුවත් කිරීමක් කළ ද භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ලිපියකින් දැනුවත් කිරීමක් පමණක් සිදු කර තිබුණි. | ඉදිරියේ දී භාවිතා කිරීමට නියමිත ස්ටිකර් සඳහා නව නිර්මාණ සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා මේ වන විට අදාල කොන්ත්‍රාත් සමාගම සමහ සාකච්ඡා කොට ඇති අතර තවද මෙම නව නිර්මාණ සැළැස්ම පිළිබඳ යෝජනා ස්ටිකර් කළමනාකරණ කමිටුව වෙතද මේ වන විට ඉදිරිපත් කර ඇත. | නව සැළැස්මක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම. |
| (ii) | පාරිභෝගිකයා වෙත ළඟා වීමට පෙර, සෑම බෝතලයකම හෝ කෑන් එකක් මතම අනුමත ඩිජිටල් සලකුණු මුද්‍රණය වීම අත්‍යවශ්‍ය සාධකයක් වුව ද නිෂ්පාදනාගාරවල සවිකර ඇති ඩිජිටල් සලකුණු මුද්‍රණ යන්ත්‍ර අක්‍රිය වීම හේතුවෙන් ඩිජිටල් සලකුණු නොමැතිව වෙළඳපොළට නිකුත් නොකළ යුතුය යන විධානය අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම. | පාරිභෝගියා වෙත ලගා වීමට පෙර සෑම බෝතලයක් හා කෑනයක් මත අනුමත ඩිජිටල් සළකුණු හෝ මුද්‍රිත ස්ටිකර් පැවතීම අත්‍යවශ්‍ය සාධකයක් වේ. නමුත් සමාගම් 02ක පැයකට නිෂ්පාදනය කරන නිෂ්පාදන ධාරිතාව ඉතා ඉහල අගයක් ගන්නා බැවින් එම සමාගම්වල ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රවලින් ඩිජිටල් සලකුණු මුද්‍රණය කිරීමේ දී බෝතල් කිහිපයක් මත ඩිජිටල් සලකුණ මුද්‍රණය නොවීම නිරීක්ෂණය වී ඇත. එම ප්‍රායෝගික ගැටළුව මග හරවා ගැනීම සඳහා මේ වන විට එම බෝතල් වෙනම හඳුනාගෙන නැවත සලකුණු මුද්‍රණය කිරීම සිදු කරනු ලැබේ. තවද මෙම ගැටළු මග හරවා ගැනීම සඳහා නවීන යන්ත්‍ර මෙවලම් යොදා ගැනීමේ අවශ්‍යතාවය කොන්ත්‍රාත් සමාගම වෙත මේ වන විට දැනුම් දී ඇත. | නිරීක්ෂණය වී ඇති ඩිජිටල් සලකුණ මුද්‍රණය නොවීමේ ප්‍රායෝගික ගැටළුව මග හරවා ගැනීම සඳහා කටයුතු කිරීම. |
| (iii) | ඩිජිටල් සලකුණු ක්‍රමවේදය යටතේ ස්ටිකර් ව්‍යාපෘති ක්‍රියාත්මක ප්‍රධාන සමාගමක එක් නිෂ්පාදනාගාරයක සිදු කළ නියදි විගණන පරීක්ෂාවේ දී කොන්ත්‍රාත් සමාගමේ අධීක්ෂණය යටතේ සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මකව තිබූ අතර, සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ සටහන් වාර්තා අනුව, යන්ත්‍රය ස්ථාපනය කරන ලද 2022 ජනවාරි 11 දින සිට 2023 ජනවාරි 31 කාලය තුළ එනම්, ආසන්න මාස 13 ක් තුළ අවස්ථා 813 ක දී මුද්‍රණ යන්ත්‍රය අක්‍රියව පැවතුනි. සුරාබදු නියෝග අංක 07/2021 නියෝගයට අනුකූල නොවන අයුරින් 2022 ජනවාරි 11 දින සිට 2023 ජනවාරි 31 දක්වා කාලය තුළ මත්පැන් බෝතල් 4,904,369 ස්ටිකර් මුද්‍රණය නොවී වෙළඳපොළට නිකුත් වී තිබුණි. | එම නිෂ්පාදනාගාරයේ මෙම ව්‍යාපෘතිය ආරම්භයේදීම යන්ත්‍රවල ඇති වූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ඩිජිටල් සලකුණු මුද්‍රණය ප්‍රමාද වී තිබුණි. මේ වන විට එම යන්ත්‍රවල ප්‍රායෝගික ගැටළු මග හරවා ගනිමින් අඛණ්ඩව ඩිජිටල් සලකුණු මුද්‍රණය සිදු කිරීම සඳහා කටයුතු සම්පාදනය කොට ඇත. තවද යන්ත්‍රවල ප්‍රායෝගික ගැටළු මග හරවා ගැනීම සඳහා නවතම යන්ත්‍ර සූත්‍ර ඒ සඳහා ගෙන්වා ගැනීම සඳහ කොන්ත්‍රාත් සමාගම දැනුවත් කොට ඇත. | යන්ත්‍රවල ප්‍රායෝගික ගැටළු මග හරවා ගැනීම සඳහා කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | මත්පැන්, ව්‍යාජ මත්පැන් හෝ නිර්ව්‍යාජ මත්පැන් බෝතලයක් ලෙස සාමාන්‍ය ජනතාවට හඳුනා ගැනීම සඳහා සඳහා මෘදුකාංගයක් හඳුන්වා දී තිබුණ ද වාර්තාකරණ මොඩියුලයෙහි ගැටළු පැවති බව නිරීක්ෂණය විය. සංශෝධිත මෘදුකාංග පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීමේ ප්‍රමාදය මත පරිශීලකයන්ගේ දැනුම නොමැතිකම මත මෙහෙයුම්වලදී ගැටළු පැන නැගී තිබීම, ව්‍යාපෘති කළමනාකරුවෙකු මෘදුකාංග විශ්ලේෂකයෙක් අනියුක්ත නොකිරීම සහ වාර්තාකරණ මොඩියුලය සංවර්ධනය කිරීම සිදු කර නොමැති වීම නිසා අවශ්‍ය විටෙක දී මෙහෙයුම් සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් ලබා ගැනීමට නොහැකි වීම, කොන්ත්‍රාත් සමාගම සුරාබදු දෙපාර්තුමේන්තුවේ හෝ නිෂ්පාදකයන්ගේ භෞතික තොග සත්‍යාපනය සමඟ සංසන්දනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් මෘදුකාංගය මඟින් සලසා නොතිබුණි. | සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ව්‍යාජ මත්පැන් හෝ නිර්ව්‍යාජ මත්පැන් බෝතලයක් සාමාන්‍ය ජනතාවට හඳුනා ගැනීම සඳහා මෘදුකාංගයක් එකක් හඳුන්වාදී ඇත. ආරම්භයේ දී එහි හා එහි වාර්තාකරන මොඩියුලය ගැටළු පැවතුනද මේ වන විට එම සියළු ගැටළු නිරාකරණය කොට ඇත. | එම මෘදුකාංගයෙහි හා වාර්තාකරන මොඩියුලයට අදාළ ගැටළු නිරාකරණය කිරීම හා අනිකුත් පහසුකම් ප්‍රවර්ධනයට කටයුතු කල යුතුය. |
| (v) | මාසිකව අර්ධ වශයෙන් මුද්‍රණය සහ මුද්‍රණය නොවීම පිළිබඳ වාර්තාවක් මොඩියුලය මඟින් ලබා ගැනීමට පහසුකම් සලසා නොතිබීම, අවශ්‍ය බිඳ වැටීම් සහිතව දිනකට මුද්‍රණය කරන ලද ඩිජිටල් සලකුණු ප්‍රමාණය සත්‍යාපනය කර ගැනීම සඳහා වාර්තා කරන මොඩියුලය මඟින් නිරන්තරයෙන් කාර්මික ගැටළු පැන නැගීම, සවිස්තරාත්මක ඩෑෂ් පුවරුවක් සැපයීම වැනි අවශ්‍ය පහසුකම් සලසා නොතිබීම, සුරාබදු දෙපාර්තුමේන්තුව සඳහා තත්‍ය කාලීන,දෛනික හා කාලාන්තර මෙහෙයුම් නිරීක්ෂණය කිරීම සහ මුද්‍රණය වීමේ දී ප්‍රතික්ෂේප වීම් හඳුනා ගැනීම සඳහා උපාංගයක් හඳුන්වා දී නොතිබුණි. | මාසිකව අර්ධ වශයෙන් මුද්‍රණය සහ මුද්‍රණය නොවීම පිළිබඳ වාර්තා ලබා ගැනීම සඳහා බිඳවැටීම් සම්බන්ධව දිනකට මුද්‍රණය කරන ලද ඩිජිටල් සලකුණු ප්‍රමාණය සත්‍යාපනය කර ගැනීම සඳහා සවිස්තරාත්මක ඩෑෂ් පුවරුවක් සැපයීම සඳහාද ආයතනය දැනුවත් කොට ඇත. මෙම ඩෑෂ් පුවරුව හා අදාල වාර්තා ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත් ආයතනය විසින් මේ වන විට අධ්‍යාන හා පර්යේෂණ අංශයක් ස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. එමගින් අවශ්‍ය වාර්තා ලබා ගැනීම, දෛනික මෙහෙයුම් නිරීක්ෂණය සඳහා අවශ්‍ය ඩෑෂ් පුවරුව ස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. තවද මේ වන විට අවශ්‍ය උපාංග සෑම සුරාබදු නිලධාරියෙකුටම ලබා දී ඇති අතර එම මෘදුකාංගය නිසියාකාරව ක්‍රියාත්මක වේ. | එම |
| (vi) | මුද්‍රණය නොකළ හෝ අර්ධ වශයෙන් මුද්‍රණය කරන ලද බෝතල් සහ කෑන් හඳුනා ගැනීම සඳහා යන්ත්‍රයක් හෝ උපාංගයක් හඳුන්වා දී නොතිබීම මගින් ඩිජිටල් සලකුණු ස්වයංක්‍රීයව සක්‍රීය වන බව කොන්ත්‍රාත් සමාගම ප්‍රකාශ කළ ද මෘදුකාංගය තුළින් තහවුරු කර ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් සලසා නොතිබීම ප්‍රධාන කාර්යාලයේ සැපයුම්දාම නියාමන අංශයේ ක්‍රියාවලිය බිඳ වැටුනු අවස්ථා පිළිබඳව තොරතුරු ලේඛන ගත කර පවත්වා ගෙන | පෙර සඳහන් කළ පරිදි මුද්‍රණය නොකළ හෝ අර්ධ වශයෙන් මුද්‍රණය කරන ලද බෝතල් හා කෑන් හඳුනා ගැනීම සඳහා කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර ඇති අතර, ඔවුන් විසින් මෙම ගැටළු මග හරවා ගැනීම සඳහා අධ්‍යයන හා පර්යේෂණ අංශයක් ස්ථාපනය කිරීමට යෝජනා කර ඇති අතර තවද නිෂ්පාදනාගාර තුළ මුද්‍රණය නොවූ හා අර්ධ වශයෙන් මුද්‍රණය කරන ලද | අඛණ්ඩ සුපරීක්ෂණයක් හා අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම තුලින් එකඟ වූ ගිවිසුම් ප්‍රකාරව ගිවිසගත් කාලය තුල පද්ධතියට අදාළ සියළු කාර්යයන් නිසිලෙස ඉටුවන බවට |

| | | | |
|---|---|---|---|
| | නොයන බව නිරීක්ෂණය විය. | බෝතල් හා කෑන් හඳුනා ගැනීම සඳහා ප්‍රතික්ෂේපිත මාර්ගයක් ස්ථාපනය කිරිමට යෝජනා වී ඇතත් නිෂ්පාදනාගාරවල පවතින ඉඩ පහසුකම් නොමැති කම හේතුවෙන් එය තවමත් ක්‍රියාත්මක වී නොමැත. තවද මෙම ගැටළු මග හරවා ගැනීම සඳහා කොන්ත්‍රත් ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ අංශය ස්ථාපනය කිරීමෙන් පසු නවතම යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම කෙරෙහි ද අවධානය යොමු වී ඇත. | කළමණාකාරීත්වය විසින් තහවුරු කර ගත යුතුය. |
| (vii) | නියෝග අංක 7/2021 සුරාබදු නිවේදනයේ 5(2) රීතියට අනුව ගුවන් තොටුපළ සහ වරායන් ඇතුළු අනිකුත් ස්ථානවල ක්‍රියාත්මක වන තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම්වල දී ආරක්ෂිත සළකුණ ඇලවීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු වන බව විගණනයට තහවුරු නොවුණි. තව ද තානාපති සේවය, ශ්‍රී ලංකන් එයාර් ලයින් හා ශ්‍රී ලංකා කේටරින් යන ආයතන තීරු බදු රහිත ආයතන නොවූව ද ස්ටිකර් කමිටුවේ නිර්දේශය මත ස්ටිකර් යෙදීම පිළිබඳ පසු විපරමක් සිදු කරනොතිබුණි | ගුවන් තොටුපල හා වරාය ඇතුළු අනෙකුත් ස්ථානවල ක්‍රියාත්මක වන තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන සුරා බද්ද යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම් වලදී ආරක්ෂිත සලකුණ ඇලවීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා රේගුව වගකිව යුතු වේ. සුරාබදු නිලධාරීන් වෙත බන්ධිත ගුදම් පරීක්ෂාව සඳහා අවසර නොමැති අතර ස්ටිකර් ඇලවීමෙන් පසු තීරුබදු රහිත සාප්පු තුළ පවතින මත්පැන් බෝතල් පරීක්ෂා කිරීම සඳහා සුරාබදු නිලධාරීන්ට අවසර ඇති අතර මේ වන විට සුරාබදු නිලධාරීන් විසින් එම තීරුබදු රහිත සාප්පු පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. තවද සුරාබදු දෙපාර්තමේන්තුවේ සැපයුම් දාම නියාමන අංශය විසින් තානාධිපති සේවය. ශ්‍රී ලංකා එයාර් ලයින්, ශ්‍රී ලංකා කේටරින් ආයතන වලට අවශ්‍ය මත්පැන් සඳහා ස්ටිකර් අදාල රේගු නිලධාරියා වෙත නිකුත් කරනු ලබන අතර ඔහු විසින් එම ස්ටිකර් ලබා ගත් බවට සහතික කොට අත්සන් තැබූ ලිපි ලේඛන සැපයුම් දාම නියාමන අංශය විසින් ගොනු පවත්වා ගෙන යනු ලබයි. | අඛණ්ඩ සුපරීක්ෂණයක් හා අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම තුළින් තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම්වල දී ආරක්ෂිත සළකුණ ඇලවීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු වන බවට කළමණාකාරීත්වය විසින් තහවුරු කර ගත යුතුය. |
| (viii) | ස්ටිකර් අතින් ඇලවීමේ අවශ්‍යතාවය පුරෝකථනය කිරීම සඳහා සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 22 ක් සහ ධාන්‍ය නිෂ්පාදන සමාගම් 02 කට අදාළ නිෂ්පාදන අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දි ඇණවුම් කරන ප්‍රමාණයට අදාළව මත්පැන් නිෂ්පාදකයින් සතු තොග ප්‍රමාණය සහ වෙළඳපොල තුළ පවතින තොග ප්‍රමාණය පිළිබඳ නිවැරදි පුරෝකථනයක් සකස් කළ බවක් නිරීක්ෂණය නොවිය. තව ද පවතින තොග සඳහා ස්ටිකර් ඇලවීම 2021 ඔක්තෝම්බර් 16 දිනැති අංක 10/2021 දරන සුරාබදු නිවේදනය මඟින් 2022 අප්‍රේල් 01 දිනට පෙර නිම කිරීම දක්වා නැවත සංශෝධනය වුව ද 2022 වර්ෂයේ තොග අවශ්‍යතා | මත්පැන් නිෂ්පාදකයන් සතු තොග ප්‍රමාණය හා වෙළඳපොල තුල පවතින තොග ප්‍රමාණය පුරෝකථනය කර ස්ටිකර් ප්‍රමාණයන් ඇනවුම් කල අතර මෙහිදී නිෂ්පාදකයන් සතු තොග ප්‍රමාණය නිවැරදිවම පුරෝකථනය කල හැකි වුවත් වෙළඳපොල තුල පවතින වෙනස්කම් හේතුකොටගෙන වෙළඳපොල තුල පවතින මත්පැන් තොග ප්‍රමාණය නිවැරදි පුරෝකථනයක් කල නොහැක. තවද ස්ටිකර් ව්‍යාපෘතිය ආරම්භ වන දිනය විවිධ දුෂ්කරතා හේතුවෙන් කලින් කලට වෙනස් | ස්ටිකර් ව්‍යාපෘතිය ක්‍රියාත්මකක කිරීමේ අරමුණ හඳුනාගෙන පැවති අවදානම් සඳහා තාත්වික ඇස්තමේන්තුකරණය ක් සිදුකිරිම. |

| | | | |
|---|---|---|---|
| | හා ගැළපෙන ස්ටිකර් තොග අවශ්‍යතාවයන් කොපමණ ද යන්න ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | වීම හේතුකොට ගෙන වෙළඳපොල තුල පවතින මත්පැන් තොග ප්‍රමාණයන් නිවැරදි පුරෝකථනයක් කිරීමට දුෂ්කර විය.<br><br>2022 මුළු වර්ෂය සඳහාම ස්ටිකර් තොග අවශ්‍යතාවයන් රටේ පවතින ආර්ථික තත්වය හේතු කොටගෙන නිවැරදි ඇස්තමේන්තු සකස් කල නොහැකි අතර නිෂ්පාදනාගාර වලින් එවනු ලබන මාස 3 ක පුරෝකථනයන් පදනම් කරගෙන ස්ටිකර් තොග කොන්ත්‍රාත් ආයතනයෙන් ලබාගෙන ඇත. | |
| (ix) | 2022 ඔක්තෝම්බර් 14 දින දක්වාම සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල 08 ක් වෙත නිකුත් කර තිබූ ආරක්ෂිත සලකුණු එකතුව 16,595,500 ක් සම්බන්ධයෙන් අලවන ලද මුළු ස්ටිකර් ප්‍රමාණය සම්බන්ධව කිසිදු වාර්තාවක් සහ ඉතිරි තොග සැපයුම්දාම අංශය වෙත හෝ ස්ටිකර් අංශය වෙත භාර දී නොතිබුණත්, සහකාර සුරා බදු කොමසාරිස් බස්නාහිර පලාත් (I) සහ (II) කාර්යාලය වෙත ලබා දී තිබූ එකතුව 7,435,000 ක ස්ටිකර් ප්‍රමාණයෙන් එකතුව 213,540 ක් නැවත භාර දී තිබුණ ද ඉතිරි ස්ටිකර් තොගය වන එකතුව 7,221,460 ක ප්‍රමාණය පිළිබඳව අලවන ලද බවට හෝ කාර්යාල සතුව පවතී ද යන්න විගණනයට තහවුරු නොවීම සහ බස්නාහිර පලාත් (III) සහ මධ්‍යම පළාත වෙත ලබා දී තිබුණු ස්ටිකර් වලින් එකතුව 2,757,410 ක් ප්‍රමාද වී නැවත භාර දී තිබුණි. ස්ටිකර් 930,000 ක ප්‍රමාණයක් විගණන දින දක්වාම නැවත භාර දී නොතිබුණු බව ද නිරීක්ෂණය විය. | සහකාර සුරාබදු කාර්යාල 8 විසින් ඉතිරි ස්ටිකර් ප්‍රමාණයන් හා ඉතිරි ස්ටිකර් ප්‍රමාණයන් පිලිබඳ වාර්තා සැපයුම් දාම නියාමන අංශයට බාර දී ඇත. එම කාර්යාල වල අත ඉතිරි ස්ටිකර් තොග නොතිබුණු බවත් ස්ටිකර් සියල්ල අලවා අවසන් බවත් විමසා බැලීමේදී තහවුරු විය. | එම |
| (ඇ) | ස්කාගාර 02 ක් සඳහා 2021 සහ 2022 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරය විසින් නිකුත් කරන පරිසර ආරක්ෂණ වාර්තාව ලබා ගෙන නොතිබිය දී, පිළිවෙලින් බලපත්‍ර කාලය අවස්ථා 11 ක දී සහ අවස්ථා 09 ක දී ස්කාගාර බලපත්‍ර කාලය දීර්ඝ කර තිබුණි. ඒ අනුව ජාතික පාරිසරික පනතේ විධිවිධානයන්ට අනුව ඝන අපද්‍රව්‍ය සහ අපදියර බැහැර කිරීම සඳහා වූ ක්‍රමවේදයේ අනුකූලතාවයන් තහවුරු කර ගන්නේ කෙසේද යන්න විගණනයට තහවුරු නොවුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රය නොමැතිව බලපත්‍රය නිකුත් කිරීමට හේතු විය. රාජ්‍ය අනුග්‍රහය මත නව කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කරමින් මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික නිර්ණායකයන් සපුරා ගැනීමට කටයුතු කරන බවත්, එය අදාල වර්ෂය තුළ නිම කළ හැකි බවත්, ඒ අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම වර්ෂය තුළදීම ලබා ගත හැකි වන බවත්, බලපත්‍රධාරී විසින් දන්වා තිබීම. | ජාතික පාරිසරික පනතේ කොන්දේසි වලට අනුකූලව බලපත්‍ර නිකුත් කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සැපයීමටත්, නීති විරෝධී වෙළඳාම මැඩලීමටත්, අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාළව දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් එවැනි පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. | මූලික වශයෙන් එකී අවදානම් ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඒවා අධ්‍යයනය කිරීම සඳහා අදාළ කමිටුවක් පත් කොට ඇත. ඊට අදාළ විශේෂඥ දැනුම සුදුසසෙකුගේ සේවය ලබා ගැනීමට අපොහොසත් විය. ක්‍රමවේදය අධ්‍යයනය කිරීමේ කටයුතු කරමින් පවතී. තවද<br>RASED පරිගනක පද්ධතිය ස්ථාපිත කිරිම පිණිස කඩිනම් කිරීම ,සමස්ථ මත්පැන් සැපයුම් දාමය අධීක්ෂණයට හා පරීක්ෂණයට ලක් කිරීම, විගණන, පරීක්ෂණ, තත්වපාලන හා නියාමන කටයුතු නීත්‍යානුකූල මත්පැන් නිෂ්පාදනය ඍජු අධික්ෂනය බලපත්‍ර නොමැති හා අඩු ප්‍රදේශ සඳහා නව බලපත්‍ර ලබාදීම .බලපත්‍ර රහිතව ක්‍රියාත්මක වන නව ක්ෂේත්‍රයන් සඳහා නව සුරාබදු බලපත්‍ර ක්‍රමයක් ස්ථාපිත කිරීම , නව සුරාබදු පනතක් හඳුන්වාදීමට අවශ්‍ය පියවර ගැනීම, අවශ්‍ය පියවර ගැනීමටට කටයුතු කෙරේ. | අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ප්‍රමිතියෙන් තොර මත්පැන් නිෂ්පාදනය මඟින් ඇතිවිය හැකි අවධානම අවම කිරීම සඳහා දේශීය මත්පැන් හා මෙරට නිෂ්පාදිත විදේශ මත්පැන් හා ධාන්‍ය මත්පැන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා කාර්මික තාක්ෂණ ආයතනය සමඟ එක්ව මත්පැන් වර්ග 11 ක් සඳහා නිර්ණායක 16 ක් යටතේ ප්‍රමිතීන් සකස් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදන විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ප්‍රමිතින් සම්බන්ධ ගැසට් නිවේදන නිකුත් වී නොතිබුණි. තව ද මහ රා , සකේ වයින් සඳහා ප්‍රමිති මෙතෙක් සකස් කර නොතිබූ අතර ඒ හේතුවෙන් ඒ සම්බන්ධ විධිමත් නියාමනය ද ප්‍රමාද වෙමින් පැවතිණි. | ගැසට් නිවේදන මේ වන විට සැකෙසෙමින් පවති. මෙම ප්‍රමිතීන් හා ඒ සම්බන්ධ සියලුම තොරතුරු ඇතුලත් ලිපිය හා එම ප්‍රමිතීන් සටහනක් ලෙස සියලුම මත්පැන් නිශ්පාදනාගාර බලපත්‍ර ලාභීන් වෙත යවා ඇත.<br><br>මහ රා සම්බන්ධව සහ සකේ හා වයින් සඳහා ප්‍රමිතීන් සකස් කොට එම ප්‍රමිතීන් බලාත්මක වන ලෙස ගැසට් නිවේදන ඉදිරිපත් කිරීමද කඩිනම් කිරීමට හැකි ඉක්මණින් කටයුතු කෙරේ. | ප්‍රමිතීන් සකස් කර එම ප්‍රමිතීන්ට අනුකූලව මත්පැන් නිෂ්පාදනය වන බවට අධීක්ෂණය කල යුතුය. |
| (ඊ) | සුරාබදු දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය රාජකාරියක් වන නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය දර්ශකයන් ලෙස යොදා ගන්නා කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව හැකිතාක් 50,000 ක සීමාවට ආසන්නව තබා ගැනිමේ අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශය විසින් අවධාරණය කර තිබුණි. වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තුවකට 10,434 බැගින් අපරාධ ග්‍රහන ඉලක්ක 41,736 ක් සමාලෝචිත වර්ෂය සඳහා | 2022 වර්ෂයේ පැවති ආර්ථික,සමාජීය හා දේශපාලනික හේතු මත නිලධාරීන්ට අවශ්‍ය ඉන්ධන හිඟය, විදුලිබල ඇණ හිටීම් සහ ආර්ථිකමය පසුබෑම ග්‍රහණ ඉලක්ක අවස්ථා දෙකකදී සංශෝධනය කර ඇත.<br>. | සුරාබදු දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය රාජකාරියක් වන නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය දර්ශකයන් ලෙස යොදා ගන්නා කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | සැලසුම් කර තිබුණි. එය පළමු කාර්තුව තුළ දී ග්‍රහන ඉලක්ක 41,108 දක්වා 628 කින් වැඩි කිරීමෙන් ද දෙවන කාර්තුව තුළ දී ග්‍රහන ඉලක්ක 32,886 ලෙස 8,222 කින් අඩු කර නැවතත් 27,748 ක් දක්වා ඉන්ධන හිඟය, විදුලි බල ඇණ හිටීම් සහ ආර්ථිකමය පසුබෑම හේතුවෙන් 5,138 කින් අඩු කර සංශෝධනය වී තිබුණි. කෙසේ වුව ද අපරාධ ග්‍රහන 35,381 ක ප්‍රමාණයක් සිදු කර තිබුණි. | | හැකිතාක් 50,000 ක සීමාවට ආසන්නව තබා ගැනිමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමුකල යුතුය. |
| (ඇ) | සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පැවරී ඇති පනත් 04 යටතේ සමාලෝචිත වර්ෂයේ සිදු කළ සමස්ථ අපරාධ ග්‍රහනයන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ අපරාධ ග්‍රහනයන් 3,727 කින් හෙවත් සියයට 10 ප්‍රතිශතයකින් අඩු වීමක් නිරීක්ෂණය විය. | හමුවේ දිවයින තුළ පැවති කළබලකාරී හා අවිනිශ්චිත තත්වය තුළ දිවයින පුරා නීති ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් සිදු කිරීම දැඩි සම්පත් හිඟය සහිත සුරාබදු දෙපාර්තමේන්තු නිලධාරීන් හට අභියෝගයක් වූ තත්වයන් යටතේ ග්‍රහණ ප්‍රමාණය අඩු වීමක් සිදු වීම සාධාරණීකරණය කිරීම කළ හැකි බව | එම |
| (ඈ) | 2022 ක්‍රියාකාරී සැලැස්මේ වර්ෂයට සැලසුම් කළ කාර්මික අපරාධ ග්‍රහන ප්‍රමාණය 3,600 කාර්තුමය ප්‍රගති වාර්තා අනුව පිළිවෙලින් 1,244 කින් වැඩි වී හා නැවත 1,574 කින් අඩු වී 3,270 ක් ලෙස සංශෝධනය වී තිබුණි. කෙසේ වුවද අපරාධ ග්‍රහන 4,155 ක ප්‍රමාණයක් සිදු කර තිබුණි. කාර්මික අපරාධ ඉලක්ක සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පරික්ෂාවේ දී සුරාබදු ස්ථාන සඳහා 2022 වර්ෂයට දී තිබුණු ඉලක්කයන් සියයට 33 කින් අඩු කර තිබියදීත් ඉලක්ක සැපිරීම සියයට 100 කට වඩා අඩු වී තිබුණු සුරාබදු ස්ථාන 13 ක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණ නිවැරදිය. | 2022 ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |

### 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව 2022 වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023 ජුනි මස 06 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ 7.1 පරිච්ඡේදයේ අනුකූලතා වාර්තාව අනුව අනුකූල නොවීම් 8 ක් නිරීක්ෂණය විය. තවද එහි අංක 2,8 හා 9 යන අනුමාතෘකා යටතේ වූ අනු අංක 2.1, 2.3 ,8.1 හා 9.1 හි කරුණු ඉටුකර ඇති බව සඳහන් කර තිබුණ ද විගණන පරීක්ෂාවේ දී එම කරුණු අනුකූල නොවුණු තත්ත්වයන් බව නිරීක්ෂණය විය.

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2022 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 16 කින් විමසුම් 04 ක් සඳහා 2023 ජුනි 15 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුව අරමුණු 15 කට අදාළව ලඟා කර ගත යුතු ඉලක්ක 37 කින් සමාලෝචිත වර්ෂය සඳහා අරමුණු 05 ක් යටතේ ඉලක්කයන් 07 ක් හඳුනා ගෙන තිබුණු අතර එහි ඇතුළත් පාරිසරික හා සමාජීය ආරක්ෂණය සඳහා හඳුනා ගත් තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා රැස්වීම්වල දී ද අවධානය යොමු කර නියෝග ලබා දී තිබුණි. රසායනාගාරයක් ස්ථාපිත කිරීම හා අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම සඳහා යෝජිත පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රමවේද ස්ථාපිත කිරීම හා උත්පාදන වන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම හා ඒවා ප්‍රතිචක්‍රීකරණය ආදී ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි. | 2022 සිව් වන කාර්තුවට අදාලව ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාව අනුව මත්පැන් සඳහා නිසි ප්‍රමිති හඳුන්වා දීම 65% ක්, රසායනාගාර ස්ථාපිත කිරීම 40% ක් සහ වාර්ෂික සුරා කර්මාන්තයෙන් අපද්‍රව්‍ය උත්පාදනය වීම වැලැක්වීම සඳහා යෝජිත පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රමවේද ස්ථාපිත කිරීම හා උත්පාදනය වන අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරිම හා ඒවා ප්‍රතිචක්‍රීකරණය නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම 85% කින්ද ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය යටතේ වූ අරමුණු 15 කින් හඳුනාගෙන තිබූ අරමුණු 05 ක් යටතේ වූ ඉලක්කයන් 07 ඉටුවීම සම්බන්ධව වාර්ෂිකව ඇගයීමක් කල යුතුය. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුරාබදු ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගනු ලබන 1913 මෙහෙයුම් මැදිරිය වෙත 2022.01.01 දින සිට 2022.12.31 දක්වා කාලපරිච්ඡේදය තුළ පැමිණිළි 1,552 ක් ලැබී තිබුණු අතර, මින් 210 ක් විශේෂ මෙහෙයුම් ඒකකය වෙත ද පැමිණිළි 1,342 | 1913 සුරාබදු මෙහෙයුම් මැදිරිය වෙත මහජන පැමිණිළි සම්බන්ධයෙන් පැමිණිල්ලක් ECMS පද්ධතිය මගින් යොමුකර මාස 3ක කාලයක් තුල නොලැබුණු අවස්තාවන් වලදී සුරාබදු | 1913 සුරාබදු මෙහෙයුම් මැදිරිය වෙත ලැබෙන පැමිණිළි සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාකර සේවා සැලසිය යුතුයි. |

| | | |
|---|---|---|
| ක් ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඉන් සාර්ථක පරීක්ෂණ සිදු කර තිබුණේ ප්‍රාදේශීය කාර්යාල 419 ක් සහ විශේෂ මෙහෙයුම් ඒකක වලින් 48 ක් බව නිරීක්ෂණය විය. | කොමසාරිස් නීති ක්‍රියාත්මක කිරීම් තුමන්ගේ අත්සනින් යුතුව නිදහසට කරුණු ඇසීමේ ක්‍රමවේදයක්ද අප විසින් පවත්වාගෙන යනු ලැබේ. | |
| (ආ) 2020 සිට සමාලෝචිත වර්ෂය දක්වා අදාළව තොරතුරු ඉල්ලීම් 53 සිදු කර තිබු අතර ඉන් ඉල්ලීම් 45ක් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | නීති අංශය වෙත 2020/2021 වර්ෂය තුල තොරතුරු ඉල්ලීම් 37 ක් ලැබී අදාළ පිළිතුරු/තොරතුරු ලබා දී ඇත. | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතෙ යටතේ මහජනතාව විසින් විමසන තොරතුරු සඳහා කළමණාකරණය විසින් අනුමත කරන තොරතුරු නිසි පරිදි ලබාදීම. |

**5.2 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරික්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන සැළස්ම මගින් ක්ෂේත්‍ර 22 කට අදාළව විගණන වැඩසටහන් 36 ක් සැලසුම් කර තිබුණ ද වාර්තා 17 ක පිටපත් විගණකාධිපති වෙත ලැබී තිබුණි. එම වාර්තා මගින් පෙන්වා දී තිබුණු ගිණුම් පරිපාලන ,මෙහෙයුම්, ආදායම් නීති ක්‍රියාත්මක කිරීම් ආදි ක්ෂේත්‍රවල පාලන පද්ධතීන්වල වූ අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය ගන්නා ලද ක්‍රියාමාර්ග විගණනයට වාර්තා නොවුණි. | සමාලෝචිත වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන සැලැස්ම 2022.09.15 දින සංශෝධනය කර විගණන වැඩසටහන් 17 ක් සිදුකිරිමට සැලසුම් කර එම සියළුම විගණන වාර්තාවල පිටපත් රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. | අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන වාර්තා මගින් පෙන්වා දෙන නිරීක්ෂණය වූ අඩුපාඩු නිවැරදි කිරිම සඳහා කළමණාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව, අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරක් වසර 03 ක සිට ද, සුරාබදු කොමසාරිස් තනතුරු 01 ක් වසර 04 ක සිට ද, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 05 ක වසර 01 ත් 04 ත් අතර කාලයක සිට ද, තනතුරු පුරප්පාඩු වෙමින් පැවති අතර ඒ සඳහා රාජකාරි ආවරණය කිරීම් යටතේ නිලධාරීන් 05 දෙනෙකු සහ වැඩ බැලීම් යටතේ එක් නිලධාරියෙකු මඟින් ද රාජකාරි ඉටු කරමින් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් පාලන තනතුරට අදාළ රාජකාරි කටයුතු කිසිදු නිලධාරියෙකුගෙන් ආවරණය වී නොතිබුණි. | සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් නොමැති වීම මත දෙපාර්තමේන්තුගත අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුර, සුරාබදු කොමසාරිස් තනතුරු 02ක් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 07ක් පුරප්පාඩුව පවතින අතර රාජකාරී ඉටු කිරීම් යටතේ නිලධාරීන් 04 දෙනෙකු හා වැඩ බැලීම් යටතේ නිලධාරීන් 03 දෙනෙකු රාජකාරී ඉටු කරනු ලබයි. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) තනතුර පුරප්පාඩුව පවතී. | දෙපාර්තමේන්තුවේ පැවරී ඇති කාර්යභාරය මනාව ඉටුකිරීම සඳහා පවත්නා පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මෙහෙවරට සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 38 ක සහ තෘතීය මට්ටමේ තනතුරු 77 ක පුරප්පාඩු පැවතුණි. මෙය දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යසාධනයට අහිතකර ලෙස බලපා හැකි බව නිරීක්ෂණය විය. | ජ්‍යෙෂ්ඨ මට්ටම - සුරාබදු අධිකාරී තනතුරු 8ක් බඳවා ගැනීමට කටයුතු කරමින් පවති. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 05ක් බඳවා ගැනිමට අයදුම්පත් කැඳවා ඇත. තෘතීය මට්ටම - සුරාබදු පරීක්ෂක තනතුරු 49 ක් පිරවීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ කෙටුම්පත විභාග දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | එම |